# <u>මදොන්නිනා මෑණියන්ගේ කඳුළු ගැලීම පිළිබඳ පුරාවෘත්තය</u>

Angelo Iannuso සහ Antonina Giusto යන දෙදෙනාගේ විවාහය 1953 මාර්තු 21 දින සිරකූසා හි සිදුවිය. එදින ඔවුන් දෙදෙනාට හුණුබදාමයෙන් කරන ලද මරියාතුමියගේ ත්‍රිමාන පින්තූරයක් මනාලියගේ නෑනා විසින් ත්‍යාගයක් ලෙස පිරිනමන ලදි. එය ඔවුන් දෙදෙනා විසින් ඔවුනගේ නිදන කාමරයේ සයනයේ හිසට උඩින් එල්ලා තබනු ලැබීය.

ඉන්පසු මෙම විවාහ ගිවිසගත් යුවතිය හට ඉතා කෙටි කාලයකින්ම දරුවකු පිළිසිඳ ගත්තාය. ඒ සමගම ඇය අක්මාව හා පිත්තාශය ආශ්‍රිත රෝගයකින් පෙළෙන්නට විය. මේ හේතුව නිසා සියළුදෙනාගේ මතය වූයේ දරුගැබ විනාශ කලයුතු බවයි.

එහෙත් ඇය ඇඳ ඉහ ඉද්දර එල්ලා ඇති මදොන්නිනා මෑණියන්ගේ පින්තූරයෙන් ඉල්ලා සිටියේ ඇගේ දරුවා නිරුපද්‍රිතව මෙලොව එළිය දැකීමට සලස්වා දෙන ලෙසයි. දරුවාගේ මුහුණ දැකීමෙන් පසු ඇයගේ ජීවිතය ගැන තිරණය දෙවියන්ගේ කැමැත්ත අනුව සිදුවේවා යි ප්‍රාර්ථනා කරන ලදි.

මේ අතර, ඇයගේ රෝගී තත්වය උග්‍රවීමෙන් ඇස්පෙනීම නොමැතිවිය. එහෙත් 1953 අගෝස්තු 29 වන දින උදෑසන ඇයගේ නෑනා විසින් පරිත්‍යාග කරන ලද එම මෑණියගේ පිළිරුවෙන් කඳුළු ගලන බව ඇයට දර්ශනය විය. මෙම සිදුවීම දැකබලාගැනීමට බොහෝ පිරිසක් ඇගේ නිවසට එක්රැස්වන්නට විය. ඒ හේතුවෙන් පින්තූරය නිදන කාමරයේ සිට නිවසේ ඉදිරිපස දොර ආසන්නයේ එල්ලා තැබීමට සිදුවිය. මේ ආකාරයට දින 3ක් තිස්සේ එම පින්තූරයෙන් කඳුළු ගැලීම සිදුවී ඇත. දින තුනකට පසුඃ එනම් සැප්තැම්බර් 01 වන දින මේ පිළිඳුව පරික්ෂණය කිරිමට පරික්ෂණ කණ්ඩායමක් පැමිණ ඇත. ඔවුන් විසින් කඳුළු බිංදු 30ක පමණ ප්‍රමාණයක් එකතුකරගත් පසු කඳුළුගැලීම නැතිවී ගියේය.

මේ සිදුවීමෙන් පසු එතැන සිටි බොහෝ දෙනෙක් අදහස් කළේ මෙම සිදුවීමේ තේරුම **මදොන්නිනා මෑණියන්** ඔවුන් සමග ඇස්වලින් කථාකළ බව හා ඇයගේ ශෝකය කඳුලින් ප්‍රකාශකල බවත් ය.

මේ අතරඃ පරික්ෂණ කණ්ඩායම විසින් එකතුකරගත් කඳුළු පරික්ෂණය කිරීමෙන් පසු ඔවුන් සනාථ කරගෙන ඇත්තේ මෙම කඳුළු ජීවමාන දරුවකුගේ කඳුළු වලට සමාන බවයි. ඉන්පසු මෙම පිරිස එම පින්තූරය Piazza Euripide වෙත රැගෙන ගොස් සියළුදෙනාට වන්දනා කිරිම සඳහා දේවස්ථානයක් ඉදිකරන ලදි. 1968 එම පින්තූරය මෙම දේවස්ථානයතුළ තැන්පත් කර ඇත. 1994 <u>නොවැම්බර්</u> මාසයේදි **Cardinale De Giorgi** විසින් 50වෙනි සංවත්සරය වෙනුවෙන් පින්තූරය ඉහළමාලයේ තැන්පත්කරන ලදි. ඉන්පසු **දෙවැනි ජොවන්නි පාවොලෝ පාප් වහන්සේ (Giovanni Paolo II)** විසින් එම දේවස්ථානය විවෘත කරමින් මදොන්නිනා මෑණියන්ගේ මෙම දේවස්ථානය **"සාන්තුආරියෝ කඳුළුමෑණියන්ගේ දේවස්ථානය"** ලෙස නම් කරන ලදි.